# හා පවුල සහ යාලුවෝ



කේ.ජී. ඔසදි සෙයාරා බණ්ඩාර.

හා පවුල සහ යාලුවෝ .

for more

කේ.ජී. ඔසදි සෙයාරා බණ්ඩාර.

**ISBN 978-624-208-077-2**

කෘතිය පළ කරන දිනය - 25.11.2023

කතෘගේ වෙනත් කෘති -

* අකීකරු කුඹි පැටියා.
* Baby Elephant.

# පිදුම

මෙම පොත මාගේ
ආදරණීය අම්මාට,
අප්පච්චිට සහ
අත්තම්මාට, ගෞරවනීය
විදුහල්පතිතුමියට,
4-B පන්තිභාර
ගුරුතුමියට,
විදුහල්මාතාවට,
''හා පවුල සහ යාලුවෝ''
සෙනෙහසින් පිළිගන්වමි.

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01



එකෝමත් එක කාලෙක හා
පවුලක් සතුටින් ජීවත් වුණා .

හා අම්මයි, හා තාත්තයි,හා
දුවයි තමයි  සිටියේ.

මේ අයට යාලුවෝ ගොඩක් හිටියා.
හා පවුල ජීවත් වුණේ පිදුරුවලින්
සාදාගත්ත කුඩා නිවසක.

මුව රාළ තමයි හා පවුලේ හොඳ ම
යාලුවා වුණේ.



එක දවසක් හා හාමි සහ හා හාමිනෙයි එළියට වෙලා ඉද්දී මුව රාළ මේ දෙන්නව හම්බවෙන්නෙ ආවා.

මුව රාළ වෙනද වගේ කතා කරල යන්න නෙවෙයි ආවේ.

පොඩි පණිවිඩයකුත් අරගෙනයි ආවේ.

හා හාමි මුව රාළට කැරට් පානයකුත් දුන්නා. අන්තිමට යන්න යද්දී මුව රාළ හා හාමිනේ අතට කැරට් ඇට මල්ලක් දීලා කිව්වා මේ ටික පැළ කරන්න කියලා. එතකොට ලොකු අස්වැන්නක් ලැබෙයි.




අනිත් දවසේ උදේ ම හා අම්මයි ,හා තාත්තයි කැරට් ඇට පැළ කරන්න වත්තට ගියා.

මේ හා පවුලට ලොකු ඉඩමක් තිබුණා. ඉතින් මේ දෙන්නා වත්තේ එක පැත්තක පුංචි පාත්තියක් හැදුවා.

ඊට පස්සේ කැරට් ඇට ටික පැළ කරලා හැමදාම කැරට් පැළ ටිකට සාත්තු කළා.





ඔහොම ටික දවසක් ගෙවිලා ගියා. හා අම්මයි, දුවයි කැරට් වගාව බලන්න ගියා.

සරුවට කැරට් ටික වැවිලා තිබුණා.කැරට්වල අතරින් පතර වැවිලා තිබුණු තණකොළ වල් පැළෑටි එහෙම ගලවලා කැරට් පාත්තිය සුද්ද කළා.

හා අම්මා තණකොළ ගලවන අතරතුර හා දුව ළිඳෙන් වතුර ගෙනත් කැරට් පැළවලට දැම්මා.



හා හාමිනේ ගෙදර ගිහින් හා
තාත්තට කිව්වා, මම අද කැරට්
වගාව බලන්න ගියා. හොඳට
සරුවට වැවිලා තිබුණා.

කැරට්වල අතරින් පතර තිබුණු වල්
පැළෑටිත් සුද්ද කළා.

මුවා දීලා තියෙන්නේ නම් හොඳ
කැරට් ඇට ටිකක් තමයි.



පසුවෙනිදා උදේ ම හා පවුල ම
කැරට් වගාව බලන්න ගියා. හා
අම්මයි ,හා තාත්තයි , හා දුවයි පැළ
ටිකට වතුර දැම්මා.
වතුර දමමින් ඉන්නකොට මුව රාළ
පාරේ  ඇවිදගෙන ගියා. මුව රාළ
දැකපු හා හම්ණේ මුවාට හයියෙන්
කතා කරලා කිව්වා කැරට් වගාව
බලන්න එන්න කියලා.

මුවාටත් හරි සතුටුයි මේ කැරට්
වගාව දැකලා. හා හම්ණේ මුව රාළ
දෙස බලලා කිව්වා යාළුවේ ඔයා
කළේ නම් ලොකු උදවුවක් කියලා.





ඉතින් මේ අය කතා බහ කරලා
ඉවර වෙලා මුව රාළ යන්න
ගියා.මුව රාළ ගියාට පස්සෙ හා
හාමිනේ කිව්වා අපි තව කැරට්
පාත්ති ටිකක් හදමු.

එතකොට අපිට පුළුවන් කඩ
වීදියට ගිහිල්ලා විකුණලා අපට
ඕනෑ කරන වෙනත් බඩු ගේන්න.



මේ කතාවට හා තාත්තත් කැමති
වුණා. ඊට පස්සේ හා හාමි කිව්ව
විදිහට ලොකු කැරට් පාත්ති ටිකක්
වත්ත පුරා හැදුවා.

සතුරන්ගෙන් ආරක්ෂාවට
ඉනි හිටවලා වැටවල් හැදුවා.ඒ
කාලෙ හිටිය බල්ලන්ගේ ලොකු ම
රස්සාව තමයි මුර කරන එක.

ඉතින් හා හාමි ගිහිල්ලා බලු රාළ
හාමි කෙනෙක් එක්කර ගෙන
ආවා.කැරට් වගාව රැකබලා ගන්න.



මාස කිහිපයක් ගෙවිලා ගියා. හා හාමි කැරට් වගාව බලන්න ගියා.

කැරට් අල ටික ලොකුවට හැදිලා තිබුණා.කැරට් අල ලොකු වගේ ම සරුවට තමයි හැදිලා තිබුණේ.

ඉතින් දැන් කැරට් අල ටික ගලවන්න තමයි තියෙන්නේ. හා හාමි හිතුවා හාමිනෙත් එක්ක ගෙන එන්න.

මොකද හා හාමිට නම් මෙච්චර කැරට් අල ගොඩක් තනියම ගලවන්න බැරි නිසා.




හා  හාමි ගෙදරට ගිහිල්ලා හා හාමිනෙත් එක්ක ගෙන ආවා.හා හාමිනෙත් වගාව දැකලා සතුටු වුණා.

ඉතින් මේ දෙන්නා ම කැරට් ඔක්කොම ගලවලා  කැරට් මිටි මිටි බැන්දා.  ඊට පස්සේ කැරට් ටික ගෝනිවලට දැම්මා.


දැන් නම්, හා හාමිනේටයි හා හාමිටයි හොඳට ම මහන්සියි. හා හාමි කිව්වා හෙට උදේ ම කඩ වීදිය පැත්තට යන්න ඕනෑ කියලා.





හා හාමි කලින් දවසේ කිව්ව
විදිහට ම උදේ ම කැරට්
ටිකකුත් කදේ දාගෙන උදේ
කෑමත් කාලා කඩ වීදිය
පැත්තට යන්න පිටත් වුණා.





හා හාමි කඩ වීදිය පැත්තට ළඟා වෙද්දි ටිකක් දවල් වෙලයි තිබුණේ.හා හාමිගේ  කදේ කැරට් ගොඩක් තිබුණු නිසා හෙමින් තමයි යන්න වුණේ.


කඩ වීදිය තිබුණේ කැලෑවේ මැදට වෙන්න. කැරට් ටික කදෙන් බිමට තියලා පොඩි කඩයක් හැදුවා. කැරට් ටික විකුණ ගන්න.



ටිකෙන් ටික හවස් වුණා. කැලේ සත්තු ඔක්කොම වගේ කැරට් ගන්න ආවා. හා හාමිට නෑදෑ වන හා හාමි කෙනෙකුත් කැරට් ගන්න ආවා. හා හාමි හරි ම සතුටින් තමයි කැරට් විකුණා විකුණා හිටියේ.

මුව රාළත් මේ දිහා බලන් තමයි හිටියේ. ඒත් කඩේ ළඟට ගියේ නෑ. කරදරයක් වෙයි කියලා.





හා හාමි අන්තිමට කැරට් ඔක්කොම විකුණුවා. හා හාමි සල්ලි ටික ගණන් කරලා බැලුවා.

එතකොට තමන්ට ඕනෑ බඩු ටික ගන්න ඇති තරම් සල්ලි තිබුණා. හා හාමි, කඩ වීදියේ තිබුණු වෙනත් කඩවලින් විවිධ බඩු අරගෙන මුව රාළට දෙන්න කෑම වර්ගයකුත් ගත්තා.



ඊට පස්සේ හා හාමි සතුටින් ගෙදර ගියා. ගෙදර යනකොට මුව රාළ ගෙදර හිටියා. ඉතින් හා හාමියි,  හා හාමිනෙයි  මුව රාළට ගොඩක් ස්තුති කළා.

කැරට් මල්ලකුයි,කඩ වීදියෙන් ගත්ත කෑම ටිකකුත් දුන්නා. මුව රාළටත් හරි සතුටුයි.



අන්තිම ට හා පවුලත් ගොඩක්
දියුණු වුණා.මුව රාළටත් එහෙම
තමයි. මේ දෙගොල්ලන් හැමදා ම
හොඳ යාලුවෝ විදිහට හිටියා.

පුංචි යාලුවේ ඔයත් තමන්
ගැන හිතනවා වගේ ම අනිත්
අය ගැනත් හිතන්න පුරුදු
වෙන්න. හැම මොහොතක ම
සතුටින් ඉන්න පුරුදු වෙමු.

නිමි.



## පසුවදන

නුතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නුතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01